# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2125/22 - 2019 මැයි මස 28 වැනි අඟහරුවාදා - 2019.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන වරකාපොල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ වරකාපොල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ කොටුවේගොඩ පල්ලියගුරුගේ දනුෂ නවෝදන කුමාර කොටුවේගොඩ අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායමේ නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම වරකාපොල ප්‍රාදේශීය සභාවේ තෝරා ඒවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ගම්ලත් ආරච්චිල්ලාගේ වසන්ත සිසිර කුමාර සමරතුංග නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වරකාපොල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, සජිත් වසන්ත වෙල්ගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ගම්ලත් ආරච්චිල්ලාගේ වසන්ත සිසිර කුමාර සමරතුංග, වරකාපොල ප්‍රාදේශීය සභාවේ තෝරා ඒවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සජිත් වසන්ත වෙල්ගම,
තේරීම්භාර නිලධාරී,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 27 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

06 - 245


1A - G 30174 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*